# කැලණිය විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

Centre for Open and Distance Learning
University of Kelaniya-Sri Lanka

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
(බාහිර) - 2009

මානවශාස්ත්‍ර පීඨය

බෞද්ධ සංස්කෘතිය - BUCU- E1025

බෞද්ධ මූලාශ්‍රය හා සාහිත්‍ය අධ්‍යයනය

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි | කාලය : පැය 03 යි

---

01. සංඝ සමාජයේ අනාගත යහපත් පැවැත්ම පිළිබඳ බුදුරදුන් තුළ පැවති අවධානය කෙබඳුදැයි මහාපරිනිබ්බාණ සූත්‍රය ඇසුරින් පැහැදිලි කරන්න.

02. ආහාර අනුභවය සම්බන්ධයෙන් සේඛියා ධර්මයන්හි දැක්වෙන කරුණු වර්තමාන සමාජයට කෙතෙක් දුරට අදාළ වන්නේ දැයි සාකච්ඡා කරන්න.

03. සමාජ සංවර්ධනය උදෙසා පුද්ගලයා හා සමාජය අතර කෙබඳු සම්බන්ධතාවන් පැවතිය යුතුදැයි සිගාලෝවාද සූත්‍රය ඇසුරින් පෙන්වා දෙන්න.

04. රාජ්‍යතාන්ත්‍රික යහපැවැත්ම උදෙසා සප්ත අපරිහානීය ධර්මයන්ගෙන් ඉටුවන මෙහෙවර කෙබඳුදැයි සමාලෝචනය කරන්න.

05. බුදුදහමට අනුව පුද්ගලයාගේ ආධ්‍යාත්මික සංවර්ධනය උදෙසා සෞන්දර්යාත්මක ආකල්ප උපයෝගී වන්නේ කෙසේදැයි පෙන්වා දෙන්න.

06. ජාතක කථාවන්හි දක්නට ලැබෙන උසස් සාහිත්‍යාත්මක ලක්ෂණ මොනවාදැයි අභිමත ජාතකකථා ඇසුරින් පැහැදිලි කරන්න.

07. පාලි හා සිංහල වංසකථා මහාකාව්‍ය නිර්මාණ වශයෙන් ඇගයීමට හැකිදැයි පරීක්ෂා කරන්න.

08. බෞද්ධ සාහිත්‍යයේ සංවර්ධනය උදෙසා බුද්ධචරිතය ප්‍රධාන වස්තුබීජයක් වී ඇති ආකාරය නිදසුන් සහිතව පෙන්වා දෙන්න.

09. සිංහල බෞද්ධ උපදේශ සාහිත්‍යයේ ආරම්භය හා විකාශනය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතුරින් **දෙකකට** කෙටි සටහන් සපයන්න.

    i. ලෝවැඩ සඟරාව
    ii. කාව්‍යශේඛරය
    iii. ථූපවංසය